අධ්‍යාපන පොදු සහතික උසස් පෙළ

සඳහා නියමිත

# " දිවි පැවැත්ම සඳහා නිපුණතා සංවර්ධන ව්‍යාපෘති" ක්‍රියාත්මක කිරීමේදී ශිෂ්‍යයන් මුහුණ දෙන ගැටලු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනපති
(M. Ed) උපාධිය සඳහා
ඉදිරිපත් කෙරෙන නිබන්ධනයකි.

ආර්.ඒ.බී.යූ.අයි. පෙරේරා
MED 309080726
2009 / 2010

අධ්‍යාපන පීඨය
ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
නාවල
නුගේගොඩ
2012

OPEN UNIVERSITY
70893

70893

# සංක්ෂිප්තය

නිපුණතා පිරිපුන් දරු පිරිසක් බිහි කිරීම උදෙසා වන උදාර පරමාර්ථය පෙරදැරිව 1998 වර්ෂයේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කරන ලදි. දැනුම් සමාජයක් කරා පියනඟන වර්තමාන ලෝකය හමුවේ ප්‍රායෝගික කුසලතා වර්ධනය වූ, වැඩ ලෝකය හමුවේ අභිමානයෙන් නැඟී සිටිය හැකි, දරු පිරිසක් බිහි කිරීම උදෙසා දිවි පැවැත්ම සඳහා නිපුණතා සංවර්ධන ව්‍යාපෘති අ. පො. ස. උසස් පෙළට හඳුන්වා දෙන ලදි. මෙය අ.පො.ස උසස් පෙළ ශිෂ්‍යයින් සඳහා අනිවාර්ය ප්‍රායෝගික ක්‍රියාකාරකමක් විය. ශිෂ්‍යයින්ගේ පෞද්ගලික ලැදියා හා කුසලතා මත පදනම්ව ව්‍යාපෘති තෝරා ගැනීමට හැකි වීම මෙහි විශේෂ ලක්ෂණයකි. නව යොවුන් වියේ පසුවන සිසුන් තුළ නිදහස් චින්තනය වර්ධනයටත්, නිර්මාණශීලි මනසක් බිහි කිරීමත්, ප්‍රායෝගික කුසලතා වර්ධනය කිරීමටත්, ස්වයං මෙහෙයවීම, ගැටලු නිරාකරණ කුසලතා වර්ධනයටත්, කණ්ඩායමක් සමඟ කටයුතු කිරීමේදී සහයෝගය වර්ධනයට හා සීමිත මානව හා භෞතික සම්පත් භාවිත කොට අභියෝග ජය ගැනීමේ හැකියා දියුණු කිරීමටත් අවැසි කුසලතා ඇති කිරීම මෙ මඟින් අපේක්ෂා කරන ලදි

හඳුන්වා දී දශකයකට අධික කාලයක් ගෙවී ගිය තැන පාසල් පද්ධතිය තුළ දිවි පැවැත්ම සඳහා නිපුණතා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක ස්වරූපය පිළිබඳ පසු විපරමක් සිදුකිරීමේ අවශ්‍යතාව ඉස්මතු විය. දිවි පැවැත්ම සඳහා නිපුණතා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ශිෂ්‍යයන් මුහුණ දෙන ගැටලු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් යන මැයින් පර්යේෂණ අධ්‍යයනයක් දියත් වූයේ එහෙයිනි.

මෙම පර්යේෂණ අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ අ.පො.ස උසස් පෙළට හඳුන්වා දුන් දිවි පැවැත්ම සඳහා නිපුණතා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ශිෂ්‍යයන් මුහුණ දෙන ගැටලු පිළිබඳ අධ්‍යයනය කිරීමයි. එමෙන්ම විද්‍යාල තලය තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක වන ආකාරය විමසා බැලීම, ව්‍යාපෘති පිළිබඳ ශිෂ්‍ය අදහස් විමසා බැලීම, පාසල මඟින් ශිෂ්‍යයන්ට ව්‍යාපෘති පිළිබඳ ලබා දෙන මඟපෙන්වීමේ ස්වරූපය අධ්‍යයනය හා හඳුනාගත් ශිෂ්‍ය ගැටලු සඳහා විසඳුම් හා යෝජනා ඉදිරිපත් කිරීම යන මූලික අරමුණු ඉටු කර ගැනීම උදෙසා අධ්‍යයනය දියත් කරන ලදි.

අධ්‍යයනයේ නියැදිය ලෙස බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල කලාපයේ ඇති 1 AB පාසල් අතරින් 1 AB පාසල් හතරක් සරල අහඹු නියැදි ක්‍රමය යටතේ තෝරා ගන්නා ලදි. එම පාසල් හතරෙන් කලා, වාණිජ, විද්‍යා, ගණිත යන විෂය ධාරා නියෝජනය වන පරිදි පුම්තිරි භාවයද සළකා ලොතරැයි ක්‍රමයට අනුගතව සිසු සිසුවියන් 100 ක් හා ගුරුවර ගුරුවරියන් 16 ක් නියැදිය ලෙස තෝරා ගන්නා ලදි. තෝරා ගත් නියැදියෙන් දත්ත රැස් කිරීම උදෙසා ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා නියමාවලි, අරමුණු ගත සම්මුඛ සාකච්ඡා පර්යේෂණ උපකරණ ලෙස යොදා ගන්නා ලදි. ලබා ගන්නා ලද දත්ත ප්‍රමාණාත්මකව හා ගුණාත්මක විශ්ලේෂණයට භාජනය කරන ලදි.

දිවි පැවැත්ම සඳහා නිපුණතා සංවර්ධන ව්‍යාපෘති විෂයමාලාවට හෝ කාලරාමුවකට අනුගතව සිදු නොවන බව දත්ත විශ්ලේෂණයේදී හෙළි විය. එමෙන්ම කේවල ව්‍යාපෘති හා සාපේක්ෂව කණ්ඩායම් ව්‍යාපෘති සක්‍රිය බවත්, බොහෝ කණ්ඩායම් ව්‍යාපෘති පාසලේ ඌණතා පූර්ණය සඳහා යොමුව ඇති බවත් අනාවරණය විය. පාසලේ ව්‍යාපෘති කමිටු නිසි පරිදි ක්‍රියාත්මක නොවන බව අධ්‍යයනයෙන් හෙළි වූ සුවිශේෂී අනාවරණයකි.

පාසලේ පළමුවාරය තුළ ව්‍යාපෘති මාතෘකාව තේරීම, අරමුණු ගොඩ නැගීම, කාල රාමුව සැකසීම යන අංශ පිළිබඳ දැනුවත් කළද ව්‍යාපෘති සැළසුම් සැකසීම, ව්‍යාපෘති වාර්තා ලිවීම, ලිපි ගොනු හා ක්ෂේත්‍ර පොත් සැකසීම පිළිබඳ ලැබෙන මඟ පෙන්වීම අවම බව අනාවරණය විය. ව්‍යාපෘති ක්‍රියාවලිය අධීක්ෂණය නිසි පරිදි සිදු නොවන බවත්, පාසලේ ව්‍යාපෘති කාලච්ඡේද ක්‍රියාත්මක නොවන බවත්, ව්‍යාපෘති භාර ගුරුවරුන්ගෙන් ශිෂ්‍යයින්ට ලැබෙන සහය මඳ බවත් අනාවරණය විය. විෂය නිර්දේශය සංකීර්ණ බව, උසස් පෙළ ඇගයීම් ක්‍රියාවලිය නිසා ව්‍යාපෘති වල නිරත වීමේ කාලය සීමා සහිත වීම හා භෞතික හා මූල්‍යමය සම්පත් අවම වීමද ගැටලු ලෙස ඉස්මතු විය. මේ අනුව අනාවරණය වූයේ දිවිපැවැත්ම සඳහා නිපුණතා සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීමේදී ශිෂ්‍යයන් ගැටලු රාශියකට මුහුණ දෙන බවයි.

මෙම ගැටලු අවම කිරීම උදෙසා ශිෂ්‍යයන් සැමටම නිවැරදි දැනුවත් කිරීමක් හා මඟ පෙන්වීමක් කළ යුතුව ඇත. එසේම ගුරුවරුන් හට නිසි පුහුණුවක් ලබා දීමේ අවශ්‍යතාවයද ඉස්මතු විය. 6 - 11 ශ්‍රේණි වල සිටම ව්‍යාපෘති ක්‍රමය පිළිබඳව සිසුන් හට අත්දැකීම් ලබා දීමේ වැදගත් කම ද හඳුනා ගන්නා ලදි. දෙමාපියන් හා ප්‍රජාව දැනුවත් කිරීමද අවශ්‍ය බව හඳුනා ගන්නා ලදි. ශිෂ්‍ය ගැටලු අවම කිරීම උදෙසා කාල සටහනේ වෙන් විය යුතු ව්‍යාපෘති කාලච්ඡේද නිසි පරිදි ක්‍රියාත්මක කිරීමත් එම කාලච්ඡේද තුළ ව්‍යාපෘති සැලසුම් කිරීම වාර්තා සැකසීම කළ යුතු බවත් අවධාරණය කළ යුතුව ඇත. එමෙන්ම ව්‍යාපෘති පිළිබඳ කටයුතු කිරීමට සුදුසු, පුහුණුවක් සහිත ගුරුවරයකු අවශ්‍ය බව ද අවධාරණය කළ යුතුය. නිසි පරිදි ව්‍යාපෘති කටයුතු අධීක්ෂණය විය යුතුය. එමෙන්ම සෑම පාසලකම ව්‍යාපෘති කමිටුව සක්‍රිය විය යුතු බව පෙනේ. පාසල් පුස්තකාල සම්පත් වැඩි දියුණු කිරීම හා භෞතික සම්පත් අවමව වැය වන ව්‍යාපෘති කරා ළමුන් යොමු කිරීම මඟින් ළමුන් මුහුණදෙන භෞතික හා මූල්‍යමය ගැටලු අවමකර ගත හැක. බාහිර ආයතන, සම්පත් පුද්ගලයන් කරා ළමුන් යොමු වීමේදී පාසලෙන් නිසි මැදිහත් වීමක් සිදුවිය යුතුය.

දිවිපැවැත්ම සඳහා නිපුණතා සංවර්ධන ව්‍යාපෘති අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සංවර්ධනය කිරීමට හා හඳුන්වා දීමෙන් අපේක්ෂිත ඵල සාධනය කර ගැනීමට නම් මෙම ක්ෂේත්‍රයේ විවිධ මංපෙත් ඔස්සේ පර්යේෂණ අධ්‍යයන දියත් විය යුතුය. අනාගත පර්යේෂණ යොමු විය යුතු මාවත් පිළිබඳව ද මෙම අධ්‍යනයේ අවසානයේ ඉඟි සපයා තිබේ.